# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment


මගේ අංකය / எனது இல / My No: DSD/HO/MF/05/02/12/03
ඔබේ අංකය / உமது இல / Your No: ..........
දිනය / திகதி / Date: 2024.. 07.22

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂවරන් / සමෘද්ධි සහකාර අධ්‍යක්ෂවරුන්

සියළුම සමෘද්ධි බැකු සමිති කළමණාකරුවන්

සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමණාකරුවන්

<u>සති අන්තයේ රාජකාරී කටයුතු කිරීම සම්බන්ධවයි</u>

*ඉහත කරුණ සම්බන්ධයෙන් ගරු ජනාධිපතිතුමා වෙත යොමු කරන ලද* ලිපි හා අවස්ථා ගණනාවකදී ප්‍රධාන කාර්යාලයට කරන ලද පැමිණිලි ලිපි හා බැඳේ.

02 . අදාල පැමිණිලිවලින් ප්‍රකාශ කරන්නේ සමහරක් සමෘද්ධි බැංකු සමිති හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු සති අන්තයේ දිනවල රාජකාරී සිදු කිරීමට කාර්ය මණ්ඩලය පැමිණියද නිසි ලෙස රාජකාරියක් ඉටු නොකරන බවද සතියේ දිනවලද පෙ.ව.08.30 ට විවෘත කළයුතු වුවද නියමිත වේලාවට බැංකු විවෘත නොකරන බවද, ප්‍රකාශ කරයි.

03. මෙම පැමිණිලි පිළිබඳව විශේෂ අවදානය යොමු කොට සමෘද්ධි බැංකු සමිති හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු කාර්ය මණ්ඩල සාමාජිකයින් සතියේ දිනවල පෙ.ව.08.30 ට බැංකු විවෘත කිරීමටද,සති අන්ත දිනවල රාජකාරී සඳහා වාර්තා කරන්නේ නම් ඒ පිළිබඳව විශේෂයෙන් සැළකිලිමත් වන ලෙසද,එම දිනවල රාජකාරියේ යෙදීමේ අවශ්‍යතාවය පිළිබඳව තහවුරු කිරීම සමෘද්ධි බැකු සමිති, සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමණාකරුවන්ගේ විශේෂ වගකීමක් වන බවද වැඩිදුරටත් අවධාරණය කරමි.සිය රාජකාරී කටයුතු වඩාත් නිරවුල්ව හා කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා ලබාදී ඇති අවස්ථාවන් අයථා ලෙස භාවිතා කරන්නේ නම් අදාළ නිළධාරීන්ට එරෙහිව විනයානුකූල පියවර ගැනීමට සිදුවන බව දන්වා සිටින අතර සති අන්ත දිනවල රාජකාරී නිරතවීම පිළිබඳව අධීක්ෂණය කිරීම දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලවල විශේෂ වගකීමක් සේ සළකා කටයුතු කරන මෙන්ද කාරුණිකව දන්වා සිටිමි.

සී.ඩී.කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත :-

01.සියළුම ප්‍රාදේශීය ලේකම් වරුන් -අ.ක.සඳහා

02.සී.ජ්.සුනෙත් ලෝචන මහතා ජනාධිපති ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (මහජන සම්බන්ධතා),ජනාධිපති කාර්යාලය.ගාලු මුවදොර,කොළඹ 01- දැ.ගැ.සඳහා


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |